**වරකාපොල ප්‍රාදේශීය සභාව.**
**කෑගල්ල දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 02 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජූනි 22 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වරකාපොල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ උසාවි දඩ රු.3,902,750 ක් සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගතකර තිබුණි. | වර්ෂයට අදාලව ආදායම් නිවැරදිව හදුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | අදාල වර්ෂයේ මුදලක් ලෙස නොව හිඟ ලැබීමක් ලෙස ගිණුම්ගත කරන ලද බවත් ඉදිරියේදී ලැබෙන මුදල් සමුච්චිත අරමුදලට බැර කිරීමට කටයුතු කරන බවත් දන්වමි. |
| (ආ) | 2019 දෙසැම්බර් 31 දිනට ණය හිමියන් යටතේ දක්වා තිබූ රු. 23,362,968 ක් වූ ප්‍රාග්ධන භාණ්ඩ මිලදී ගැනීම් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කර නොතිබුණි. | ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු සඳහා ලබාදෙන ලද වට්ටම් රු. 233,943 ක් ගිණුම්ගත කර නොතිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව 2019 දෙසැම්බර් 31 දිනට පොහොර තොගයේ වටිනාකම වූ රු.231,075 ක් ගිණුම්ගත කර නොතිබුණි. | ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් පොහොර තොගය ගිණුම්ගත කිරීමට කටයුතු කරමි. |

| | | | |
|---|---|---|---|
| (ඉ) | පෙර වර්ෂ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලැබී තිබූ මුද්දර ගාස්තු හා උසාවි දඩ වෙනුවෙන් ගෙවන ලද පරිපාලන ගාස්තු පිළිවෙලින් රු.162,400 ක් හා රු.53,078 ක් සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වර්ෂයට අදාල වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කිරිමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී මුද්දර ගාස්තු හා උසාවි දඩ සඳහා ගෙවන ලද පරිපාලන ගාස්තු අදාල වර්ෂයේ වියදමක් ලෙස සටහන් කිරීමට කටයුතු කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේදී මිලදී ගන්නා ලද රු.58,895 ක් වටිනා පාරිභෝජ්‍ය භාණ්ඩ කාර්යාල උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (උ) | සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම නොවන වත්කම් ශේෂය හා ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමෙහි ශේෂය අතර රු.39,683,354 ක වෙනසක් පැවතුණි. | අදාල ගිණුම් ශේෂ සසඳා නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. | 2020 වර්ෂයේ අවසන් ගිණුමෙන් නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ඌ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් විෂයයන් 8 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.51,468,769 ක වෙනසක් පැවතුණි. | මූල්‍ය ප්‍රකාශන සහ උපයෝගී ලේඛන සසඳා නිවැරදි කිරීම් සිදු කල යුතුය. | තොරතුරු සොයා බලා ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (එ) | එකතුව රු. 9,155,400 ක් වූ ගිණුම් විෂයයන් 04 කට අදාලව ලේඛන හා උපලේඛන ඉදිරිපත් නොකෙරුණි. | ගිණුම් විෂයයන් තහවුරු කිරීමට ප්‍රමාණවත් සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. | මෙම උපලේඛන ඉදිරිපත් නොකල බව පිළිගනිමි. |

## 1.4 අනුකූල නොවීම්

### 1.4.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්

| | නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරන දේශීය ආදායම් බදු පනතේ උපයනවිට බදු ගෙවීම් වගු අංක 7 | ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරුන් 11 දෙනෙකුගේ වැටුපෙන් අයවියයුතු උපයන විට බදු රු. 376,605 ක් අයකර ගෙන නොතිබුණි. | උපයන විට බදු අයකිරීමට කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව දන්වමි. |
| (ආ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | සභාව සතු වාහන 7ක ඉන්ධන දහන පරීක්ෂාව සිදු කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | ඉදිරියේදී අඩුපාඩු සකසා ගෙන කටයුතු කරන බව දන්වමි. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 පළාත් පාලන කොමසාරිස් චක්‍රලේඛය | වසර 5කට වරක් වරිපනම් දේපල තක්සේරු කළ යුතු වුවද, 2007 වසරේ තක්සේරුව පරිදි වරිපනම් බදු අයකර තිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය. | 2017 වර්ෂයේ සිට තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීම් කළ අතර ඒ අනුව නව තක්සේරුව 2020 ජනවාරි මස සිදු කළ බවත්, ඉදිරියේදී වසර 5කට වරක් තක්සේරු කිරීම් කරන බවත් දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 27,392,493 ක්වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 22,730,526 ක් විය.

### 2.2 මූල්‍ය පාලනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහජන බැංකුවෙහි පවතින පරිසර ගිණුමෙහි රු.43,340 ක් වසර 02 ක සිට අක්‍රීයව පවතින නමුත් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ගයක් ගතයුතුය. | මේ සඳහා යෝජනාවක් මහ සභාවට ඉදිරිපත් කර විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය පරිදි කටයුතු කරන බව දන්වමි. |

### 2.3 ආදායම් පරිපාලනය

#### 2.3.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම , රැස්කල ආදායම හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කල ආදායම, රැස්කල ආදායම හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | (ප්‍රවර්ථන) රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| i | වරිපනම් හා බදු | 9,391,000 | 9,391,000 | 7,860,693 | 1, 530,307 | 8,159,000 | 8,159,000 | 6,952,137 | 1,206,863 |
| ii | කුලී | 12,540,000 | 12,540,000 | 8,977,673 | 3,562,327 | 6,718,100 | 6,718,100 | 5,959,555 | 758,545 |
| iii | බලපත්‍ර ගාස්තු | 3,610,100 | 3,610,100 | 2,056,391 | 1,553,709 | 1,385,100 | 1,385,100 | 1,444,536 | (59,436) |
| iv | වෙනත් ආදායම් | 45,961,000 | 45,961,000 | 7,653,714 | 38,307,886 | 38,804,000 | 38,804,000 | 7,318,784 | 31,485,216 |

2.3.2 පරිසර බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 ජූලි 30 දින වන විට කල් ඉකුත්වූ පරිසර ආරක්ෂණ බලපත්‍ර 12 ක අලුත් කිරීම් සිදු කර නොතිබුණි. එම හේතුවෙන් සභාවට රු.48,000 ක ආදායමක් අහිමිවී තිබූ අතර එම ව්‍යාපාර මගින් සිදුවන පාරිසරික බලපෑම පිළිබඳ කාලීන ඇගයීමක්ද සිදුව නොතිබුණි. | 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පරිසර පනත සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදාල ව්‍යාපාර වල බලපත්‍ර අලුත් කිරීමේ ක්‍රියාවලියට මේ වන විට යොමු වී ඇති බව දන්වමි. |

2.3.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු. 15,273,366 ක් වූ අතර වසරකට වඩා වැඩි අයවියයුතු ශේෂය රු.5,774,241ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා මුද්දර ගාස්තු අයවී නොතිබූ අතර ඇස්තමේන්තුගත මුදල රු. 30,000,000 ක් විය. | ආදායම් අයකර ගැනීම සඳහා අවධානය යොමු කළ යුතුවේ. | උසාවි දඩ මුදල් වර්ෂය තුල බෝහෝ විට ලැබෙන නමුත් මුද්දර ගාස්තු ලැබීමේ යම් ප්‍රමාදයක් ඇත. උසාවි දඩ උපලේඛන සැකසීම සභාවේ නිලධාරින් විසින් ඉටු කලද මුද්දර ගාස්තු උපලේඛන ඉඩම් කාර්යාලයේ නිලධාරීන් සකස් කර ලබා දෙන තෙක් සිටීමට සිදු වන බවත් දන්වමි. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව විසින් ප්‍රචාරන දැන්වීම් පුවරු ගාස්තු අයකිරීම සඳහා නව අතුරු ව්‍යවස්ථාවක් කෙටුම්පත් කර සම්මත කර ගැනිමට කටයුතු කරමින් පැවතුණි. එහි 21 වගන්තිය ප්‍රකාරව ගාස්තු රහිතව පල කලහැකි දැන්වීම්වල ප්‍රමාණය සඳහන් නොවීම හේතුවෙන් සභාවට ආදායම් අහිමි වීමේ ඉඩකඩක් පැවතුණි. | අඩුපාඩු සම්පූර්ණ කර අතුරු ව්‍යවස්ථා සම්මත කර ගැනීමට කටයුතු කළ යුතුයි. | සංශෝධනය ඇතුළත් කර අනුමැතිය සඳහා යවා ඇති බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව ඉටුකර තිබූ කාර්යයන්ගේ ප්‍රගතිය දැක්වෙන අයුරින් කාර්යසාධන වාර්තා ඉදිරිපත් කර නොතිබීම හේතුවෙන් ක්‍රියාකාරී සැලැස්මෙන් අපේක්ෂිත ප්‍රගතිය අත්කර තිබුණේද යන්න පරීක්ෂා කල නොහැකි විය. | ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය හඳුනාගත හැකිවන ලෙස කාර්ය සාධන වාර්තා සකස් කර ඉදිරිපත් කළ යුතුවේ. | 2019 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී මිනුම් නිර්නායක ඇතුළත් කිරීමට නොහැකි වී ඇති අතර ඒ සම්බන්ධ ඉදිරි ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේදී මිනුම් නිර්නායක ඇතුළත් කිරීමට කටයුතු කරමි. |
| (ii) | ආදායම් අංශයේ අරමුණු යටතේ වූ නව ආදායම් මාර්ග උත්පාදනය කිරීම හැර හිඟ ආදායම් අයකර ගැනීම සඳහා වැඩපිළිවෙලක් ඇතුලත් කර නොතිබුණි. | ආදයම් අයකර ගැනීමට පියවර ගත යුතුවේ. | වරිපනම් බදු හා අක්කර බදු හිඟ අය කිරීම සඳහා වැඩ සටහන් අඛණ්ඩව සිදු කළ බවත් ඒ අනුව 2019 වර්ෂයේ හිඟ ආදායම් රු.2,854,578 ක් අයකර ගෙන ඇති බවත් දන්වමි. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කසළ කළමනාකරණයේදී ඉතිරිවන පොලිතීන් වැනි නොදිරන කසළ බැහැර කිරීමට විධිමත් ක්‍රම වේදයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | විධිමත් ක්‍රම වේදයක් ක්‍රියාත්මක කළ යුතුවේ. | කසල කළමණාකරණයේදී අවසන් බැහැරලීම සිදුකිරීමට විධිමත් ක්‍රම වේදයක් සකස් කිරීම සඳහා හඳුනා ගෙන ඇති භූමිය ලබාගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන සපයා ගැනීමට කටයුතු කරමින් පවතී. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ගලි ලි බැහැර කිරීම සඳහා සුදුසු ස්ථානයක් සභාව සතු නොවීම හේතුවෙන් ගලි බැහැර කිරීමේ සේවාව ජනතාවට සැපයීමට නොහැකිවී තිබුණි. | ගලි බැහැර කිරීම සඳහා ස්ථානයක් සොයා ගැනීමට කටයුතු කළ යුතුවේ. | අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා භූමියක් ලබා ගැනීමට නිරීක්ෂණ කටයුතු කරමින් පවතී. |
| (ආ) | සභාව සතු සුසාන භූමි 4 ක පවතින පලදාව ලැබිය හැකි ගස් පිළිබඳ සමීක්ෂණයක් කර ලේඛන ගත කර නොතිබුණි. | ගස් කොලන් පිළිබඳ සමීක්ෂණයක් සිදු කර ලේඛණගත කළ යුතුවේ. | සුසාන භූමි වල ඇති ගස් කොළන් පිළිබඳ 2020 වර්ෂය සඳහා සමීක්ෂණය කිරීමට කටයුතු කරන බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කාර්ය මන්ඩලයේ පුරප්පාඩු 20 ක් හා අතිරික්ත 03 ක් විය. | අත්‍යාවශ්‍ය පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. | සභාවේ කටයුතු අඛණ්ඩව කාර්යක්ෂමව සිදුකරගෙන යාම සඳහා සේවා අවශ්‍යතාවයන් මත යම් යම් තනතුරු සඳහා ශ්‍රම පදනමින් හා අනියම් පදනමින් බඳවාගෙන ඇති බවත් අනුමත තනතුරුවල පුරප්පාඩු සඳහා ලිඛිතව ඉල්ලා සිටියද මේ වන තෙක් එම ඉල්ලීම ඉටුවී නොමැති බවත් දන්වමි. |

3.4 වත්කම් කළමනාකරණය

නිෂ්ක්‍රීය වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2006 වර්ෂයේදි සභාවට ලැබී තිබූ රු.1,200,000ක් වූ ට්‍රැක්ටරයක් 2018 මාර්තු 13 දින වෙන්දේසි කිරීම සඳහා ආණ්ඩුකාරවර අනුමැතියට ඉදිරිපත් කර තිබූ නමුත් එය අලුත්වැඩියා කරන ලෙස නිර්දේශ කර තිබුණි. කෙසේ වුවද, 2020 මැයි වන විටත් ක්‍රියාමාර්ගයක් නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ට්‍රැක්ටරය අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට කඩිනමින් පියවර ගත යුතුය. | වෙන්දේසි කිරීමට අනුමැතිය නොලැබුණු බවත් අලුත්වැඩියා කිරීමට කටයුතු කර ඇති බවත් දන්වමි. |

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 නොවිසඳී ඇති විගණන නිරීක්ෂණ

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු සුසාන භූමි 85 න් 65 ක් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | එම සුසාන භූමි වල අයිතිය ප්‍රාදේශීය ලේකම් සතු බැවින් එකී අයිතිය සභාවට පවරා දෙන ලෙස සභා යෝජනාවක් සහිතව ප්‍රාදේශීය ලේකම් වෙත දන්වා යවා ඇත. |